සබ්බ පාපස්ප අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධාන සාසනං



# අන්තර්ගතය

1 . නමස්කාරය සහ පන්සිල් 2

3 . නවගුණ ආශිර්වාදය 3

4 . ධම්ම පදයෙන් බිදක් 4

5 . මෙත්තා භාවනාව 4

6 . ඛන්ධ පිරිත 7

7 . මෙත්තානිසංස සුත්‍රය 9

8 . කරණීය මෙත්ත සූත්‍රය 10

9 . ජය පිරිත 11

10 . මහා ජය මඞගල ගාථා 13

**සබ්බ පාපස්ස අකරණං - සියලු අකුසලින් දුරුවීම**
**කුසලස්ස උපසම්පදා - කුසල් කිරීම හා දියුණු කිරීම**
**සචිත්ත පරියෝදපනං - තමාගේ සිත පිරිසිදු කිරීම**
**ඒතං බුද්ධාන සාසනං - මේ සියළු බුදුවරයන්ගේ අනුශාසනයයි**

මෙහි අන්තර්ගත පිරිත් සූත්‍ර පිරුවානා පොත් වහන්සේ උපුටා ගනිමින් සකසා ඇත. භාවිතයේ පහසුව උදෙසා ව්‍යවහාරික සිංහල අක්‍ෂර වින්‍යාසය යොදාගෙන ඇත. නිවරදි උච්ඡාරණය සඳහා අදාල පිරිත් දේශණාවන් ශ්‍රවනය කරන ලෙසට පින් සිත් පෙරටුව ඉල්ලා සිටිමි.

අක්‍ෂර වින්‍යාසය අධ්‍යයනය සදහා පිරුවානා පොත් වහන්සේ පරිශීලනය කරීමට කාරුණික වන්න.

මෙම ව්‍යායාමයට අතහිත දුන් සැමටත් ඔවුන් නමින් මිය පරලව ගියාවූ සියලු දෙනාටත්, දිග, කෙටි, මහත, මධ්‍යම, විශාල, සියුම්, ශරීර ඇත්තෝ වූ ද, දිය ගොඩ වෙසෙන සියලු සත්තුහුද, පෙනෙන, නොපෙනෙන, දුර, ළඟ, වෙසෙන සත්වයෝද, උපතට පැමිනි සහ උපතක් සොයන සත්තූහුද, ඉපදීම අවසන් කල සත්තූහුද, ඇතුළු සියලු විශ්ව වාසීනට මෙම පිරිත් දේශණාවන්ගේ ආනුභාවයෙන් පින් අනුමෝදන් වේවා සියල්ලෝම සැප ඇත්තෝ වෙත්වා, නීරෝගී වෙත්වා, සුවපත් වෙත්වා.

**දහම් පඩුරක් ලෙස, නොමිලේ බෙදාහැරීම පිණිසයි.**
**www.paritha.org**

# න ම ස් කා ර ය

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

භාග්‍යවත් වූ අරහත් වූ සම්‍යක් සම්බුදුරජානන් වහන්සේට මාගේ නමස්කාරය වේවා

## බුද්ධං සරණං ගච්ඡාමි
## ධම්මං සරණං ගච්ඡාමි
## සංඝං සරණං ගච්ඡාමි

පළමුව මම බුදුන් සරණ යමි දහම් සරණ යමි සඟුන් සරණ යමි

## දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
## දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
## දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

දෙවනුව ද මම බුදුන් සරණ යමි දහම් සරණ යමි සඟුන් සරණ යමි

## තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
## තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
## තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තෙවනුව ද මම බුදුන් සරණ යමි දහම් සරණ යමි සඟුන් සරණ යමි

# ප න් සි ල්

## පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි

ප්‍රානඝාතයෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

## අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

සොරකම් කිරීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

## කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි

කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

## මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි

බොරුකීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

## සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

සුරා පානයෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

# නවගුණ ආශිර්වාදය

ඉතිපිසෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ
විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ
පුරිසදම්මසාරථී සත්ථාදේවමනුස්සානං බුද්ධෝභගවාති

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ

අරහං නම් වන සේක
සම්මා සම්බුද්ධ නම් වන සේක
විජ්ජා චරණ සම්පන්න නම් වන සේක
සුගත නම් වන සේක
ලෝකවිදූ නම් වන සේක
අනුත්තරෝ පුරිසදම්ම සාරථී නම් වන සේක
සත්ථා දේව මනුස්සානං නම් වන සේක
බුද්ධ නම් වන සේක
භගවා නම් වන සේක

**මෙසේ අප සම්මා බුදුරජාණන්වහන්සේ**
**නව අරහාදී බුදුගුණයන්ගෙන්**
**සමන්විත වන සේක**

නව අරහාදී බුදුගුණයන්ගේ බලයෙන් සුවපත්වේවා
නව අරහාදී බුදුගුණයන්ගේ බලයෙන් සුවපත්වේවා
නව අරහාදී බුදුගුණයන්ගේ බලයෙන් සුවපත්වේවා

# ධම්ම පදයෙන් බිදක්

| | |
|---|---|
| සබ්බේ තසන්ති දන්ඩස්ස | හැමදෙනාම දඬුවමට බය වෙති |
| සබ්බේ භායන්ති මච්චුනෝ | මරනයට බය වෙති |
| අත්තානං උපමංකත්වා | තමන් උපමාකොට සිතා |
| නහයෙය්‍ය න ඝාතයේ | අනුන් නොනසන්න අනුන් නො නසවන්න |
| | |
| සබ්බේ තසන්ති දන්ඩස්ස | හැමදෙනාම දඬුවමට බය වෙති |
| සබ්බේසං ජීවිතං පියං | සියලු දෙනාම ජීවිතයට ප්‍රිය වෙති |
| අත්තානං උපමංකත්වා | තමන් උපමාකොට සිතා |
| නහයෙය්‍ය න ඝාතයේ | අනුන් නොනසන්න අනුන් නො නසවන්න |
| | |
| සුඛ කාමානි භූතානි | සැප කැමති යම් කෙනෙකු |
| යෝ දණ්ඩේන **විහිංසති** | සැප කැමති අන් අයෙකු |
| අත්තනෝ සුඛ මේසානෝ | **පෙලයි නම්** |
| පච්චසෝ න ලභතේ සුඛං | ඔහු පරලොව **සැපතක් නොලබයි** |
| | |
| සුඛ කාමානි භූතානි | සැප කැමති යම් කෙනෙකු |
| යෝ දණ්ඩේන **නහිංසති** | සැප කැමති අන් අයෙකු |
| අත්තනෝ සුඛ මේසානෝ | **නො පෙලයි නම්** |
| පච්චසෝ න ලභතේ සුඛං | ඔහු පරලොව **සැපතක්ම ලබයි** |

# මෙත්තා භාවනාව

අහං අවේරෝ හෝමී ! හිත සත්තා
මම වෛර නැත්තෙක් වෙම්වා ! හිතවත් සත්වයෝ ද

අබ්‍යාපජ්ඣෝ හෝමී ! මජ්ඣත්තික සත්තා
තරහ නැත්තෙක් වෙම්වා ! මැදහත් සත්වයෝ ද

අනීඝෝ හෝමී ! වේරි සත්තා
දුක් විපත් නැත්තෙක් වෙම්වා ! හිතවත් සත්වයෝ ද

සුඛී අත්තානං පරිහාරාමී ! අවේරො හොන්තු !
සුවසේ වෙසෙම්වා ! වෛර නැත්තෝ වෙම්වා !

අහං විය මයිහං ! අබ්‍යාපජ්ජා හොන්තු !
මා මෙන්ම මාගේ ! තරහ නැත්තෝ වෙත්වා !

ආචාරියුපජ්ඣායා ! අනීඝා හොන්තු !
ආචාර්ය උපාධ්‍යායයෝ ද දුක් විපත් නැත්තෝ වෙත්වා !

මාතා පිතරෝ ! සුඛී අත්තානං පරිහරන්තු !
මා පියෝ ද සුවසේ වසන්නෝ වෙත්වා !

ඉමස්මිං විහාරේ සබ්බේ දේවා භවන්තු සුඛිතත්තා !
මෙම විහාරයේ සියලු දෙවියෝ සුවපත් වෙත්වා !

ඉමස්මිං විහාරේ සබ්බේ මනුස්සා භවන්තු සුඛිතත්තා !
මෙම විහාරයේ සියලු මනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

ඉමස්මිං විහාරේ සබ්බේ අමනුස්සා භවන්තු සුඛිතත්තා !
මෙම විහාරයේ සියලු අමනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

ඉමස්මිං විහාරේ සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
මෙම විහාරයේ සියලු සත්වයෝ සුවපත් වෙත්වා !

පුරත්ථිමාය දිසාය සබ්බේ දේවා භවන්තු සුඛිතත්තා !
පෙරදිග වාසී සියලු දෙවියෝ සුවපත් වෙත්වා !

පුරත්ථිමාය දිසාය සබ්බේ මනුස්සා භවන්තු සුඛිතත්තා !
පෙරදිග වාසී සියලු මනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

පුරත්ථිමාය දිසාය සබ්බේ අමනුස්සා භවන්තු සුඛිතත්තා !
පෙරදිග වාසී සියලු අමනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

පුරත්ථිමාය දිසාය සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
පෙරදිග වාසී සියලු සත්වයෝ සුවපත් වෙත්වා !

දක්ඛිණාය දිසාය සබ්බේ දේවා භවන්තු සුඛිතත්තා !
දකුණු දිග වාසී සියලු දෙවියෝ සුවපත් වෙත්වා !

දක්ඛිණාය දිසාය සබ්බේ මනුස්සා භවන්තු සුඛිතත්තා !
දකුණු දිග වාසී සියලු මනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

දක්ඛිණාය දිසාය සබ්බේ අමනුස්සා භවන්තු සුඛිතත්තා !
දකුණු දිග වාසී සියලු අමනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

දක්ඛිණාය දිසාය සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
දකුණු දිග වාසී සියලු සත්වයෝ සුවපත් වෙත්වා !

පච්ඡිමාය දිසාය සබ්බේ දේවා භවන්තු සුඛිතත්තා !
පැසුලු දිග වාසී සියලු දෙවියෝ සුවපත් වෙත්වා !

පච්ඡිමාය දිසාය සබ්බේ මනුස්සා භවන්තු සුඛිතත්තා !
පැසුලු දිග වාසී සියලු මනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

පච්ඡිමාය දිසාය සබ්බේ අමනුස්සා භවන්තු සුඛිතත්තා !
පැසුලු දිග වාසී සියලු අමනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

පච්ඡිමාය දිසාය සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
පැසුලු දිග වාසී සියලු සත්වයෝ සුවපත් වෙත්වා !

උත්තරාය දිසාය සබ්බේ දේවා භවන්තු සුඛිතත්තා !
උතුරු දිග වාසී සියලු දෙවියෝ සුවපත් වෙත්වා !

උත්තරාය දිසාය සබ්බේ මනුස්සා භවන්තු සුඛිතත්තා !
උතුරු දිග වාසී සියලු මනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

උත්තරාය දිසාය සබ්බේ අමනුස්සා භවන්තු සුඛිතත්තා !
උතුරු දිග වාසී සියලු අමනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

## උත්තරාය දිසාය සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
උතුරු දිග වාසී සියලු සත්වයෝ සුවපත් වෙත්වා !

## උපරිමාය දිසාය සබ්බේ දේවා භවන්තු සුඛිතත්තා !
උඩු වාසී සියලු දෙවියෝ සුවපත් වෙත්වා !

## උපරිමාය දිසාය සබ්බේ මනුස්සා භවන්තු සුඛිතත්තා !
උඩු වාසී සියලු මනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

## උපරිමාය දිසාය සබ්බේ අමනුස්සා භවන්තු සුඛිතත්තා !
උඩු වාසී සියලු අමනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

## උපරිමාය දිසාය සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
උඩු වාසී සියලු සත්වයෝ සුවපත් වෙත්වා !

## හෙට්ඨිමාය දිසාය සබ්බේ දේවා භවන්තු සුඛිතත්තා !
යටි වාසී සියලු දෙවියෝ සුවපත් වෙත්වා !

## හෙට්ඨිමාය දිසාය සබ්බේ මනුස්සා භවන්තු සුඛිතත්තා !
යටි වාසී සියලු මනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

## හෙට්ඨිමාය දිසාය සබ්බේ අමනුස්සා භවන්තු සුඛිතත්තා !
යටි වාසී සියලු අමනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

## හෙට්ඨිමාය දිසාය සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
යටි වාසී සියලු සත්වයෝ සුවපත් වෙත්වා !

## උද්ධං අධෝච තිරියංච සබ්බේ දේවා භවන්තු සුඛිතත්තා !
උඩ යට සරස දිග වාසී සියලු දෙවියෝ සුවපත් වෙත්වා !

## උද්ධං අධෝච තිරියංච සබ්බේ මනුස්සා භවන්තු සුඛිතත්තා !
උඩ යට සරස දිග වාසී සියලු මනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

## උද්ධං අධෝච තිරියංච සබ්බේ අමනුස්සා භවන්තු සුඛිතත්තා !
උඩ යට සරස දිග වාසී සියලු අමනුෂ්‍යයෝ සුවපත් වෙත්වා !

## උද්ධං අධෝච තිරියංච සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
උඩ යට සරස දිග වාසී සියලු සත්වයෝ සුවපත් වෙත්වා !

## උද්ධං අධෝච තිරියංච සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
## උද්ධං අධෝච තිරියංච සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
## උද්ධං අධෝච තිරියංච සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !

සදිසාවන් යනුවෙන් අරමුණු කොට ගෙන මෙත් සිත් පතුරවන්න, තමාට උඩ යට සරස යන සදිසාවන් හොඳින් ප්‍රකට වූවාට පසු, සබ්බේ සත්තා යනුවෙන් හඳුන්වන්නේ මෙ සදිසාවන් හි වෙසෙන සියලු සත්වයෝ බව දැන, ඒ සදිසාවන් අරමුණු කොට . . .

## සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
## සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !
## සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා !

යනුවෙන් සියලු දිසාවන් එක් රැස් කොට ගත් මෛත්‍රී කමටහනක හිඳිමින් ඇවිදිමින් සිටිමින් සහ හොවිමින් නින්දට යන තෙක් නිරතුරු භාවනාවක් ලෙස සිත්හි එල්බ ගෙන භාවිතාව මැනවි.

# ඛණ්ධ පිරිත

ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං විහරති
ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ,
තේන ඛෝ පන සමයේන සාවත්ථියං අඤ්ඤතරෝ භික්ඛු අහිනා
දට්ඨෝ කාලකතෝ හෝති.

මා විසින් මෙසේ අදන ලදී.
එකල එක් සමහයක භාග්‍යවතුන්වහන්සේ අනේපිඩු සිටුතුමා විසින් කරවන ලද
ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

අථ ඛෝ සම්බහුලා භික්ඛූ යේන භගවා තෙනුපසංකමිංසූ.
උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදිංසු.
ඒකමන්තං නිසින්නො ඛෝ තේ භික්ඛූ භගවන්තං එතදවෝචුං.

එ සමයෙහි සැවත්නුවර වැඩ විසූ භික්ෂු නමක් නයෙකු විසින් දෂ්ඨ කොට කලුරිය කෙළේය.
එකල්හි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි එළඹී භික්ෂූන් වහන්සේ බුදුරදුන් වැඳ එකත් පසෙක
සිටිමින් මෙ පුවත දැන්වූ සේක.

ඉධ භන්තේ, සාවත්ථියං අඤ්ඤතරෝ භික්ඛු
අහිනාදට්ඨෝ කාලකතෝ ති.
නහ නූන සෝ භික්ඛවේ භික්ඛු චත්තාරි අහිරාජකුලානි
මෙත්තෙන චිත්තෙන ඵරි ස වෙ හි සෝ භික්ඛවේ භික්ඛු චත්තාරි
අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය. නහි සෝ භික්ඛ
වේ භික්ඛු අහිනාදට්ඨෝ කාලංකරෙය්‍ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි ඒ භික්ෂු නම සතර සර්ප රාජ කුලයන් කෙරෙහි සිතින්
මෛත්‍රී නොපැතිරවී යයි හඟිමි.
මහණෙනි ඒ භික්ෂු නම සතර සර්ප රාජ කුලයන් කෙරෙහි මෛත්‍රී වැඩුයේ වී නම් සර්පයකු
විසින් දෂ්ඨ කොට කලුරිය නොකරන්නේය.

කතමානි චත්තාරි අහිරාජකුලානි විරූපක්ඛං අහිරාජකුලං,
ඵරාපථං අහිරාජකුලං, ඡබ්‍යා පුත්තං අහිරාජකුලං,
කණ්හාගෝතමකං අහිරාජකුලං.

සතර සර්ප රාජ කුලයන් නම් විරූපක්ඛල ඵරාපථ, ඡබ්‍යාපුත්තල කණ්හාගොතමකං
යන මේ සතරයි.

නහ නූන සෝ භික්ඛවේ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි
මෙත්තෙන චිත්තෙන ඵරි ස වෙ හි සෝ භික්ඛවෙ භික්ඛු ඉමානි
චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය.
නහි සෝ භික්ඛවේ භික්ඛු අහිනා දට්ඨෝ කාලං කරෙය්‍ය.

මහණෙනි ඒ භික්ෂු තෙමේ ඒකාන්තයෙන්ම මේ සතර සර්ප රාජ කුලයන් කෙරෙහි මෙත් සිත්
නොපැතිරවීය. ඒ භික්ෂු තෙමේ මේ සතර සර්ප රාජ කුලයන් කෙරෙහි මෛත්‍රී වැඩුයේ වී නම්
සර්පයකු විසින් දෂ්ඨ කොට කලුරිය නොකරන්නේය.

අනුජානාමි භික්ඛවේ ඉමානි චත්තාරි අහිරාජකුලානි
මෙත්තෙන චිත්තේන ඵරිතුං,
අත්ත ගුත්තියා අත්තරක්ඛාය අත්තපරිත්තායා ති.
ඉදමවෝච භගවා, ඉදං වත්වා සුගතෝ
අථාපරං ඒත දවෝච සත්ථා.

මහණෙනි තමාගේ සංවරය පිනිස, ආරක්ෂාව පිනිස, මේ සතර නාග කුලයන් කෙරෙහි මෙත් සිත්
පතුරවන්නට අවසර දෙමි යි පවසා, මෙසේ වදාල සේකග සුගත නම් වූ ශාස්තෘන්වහන්සේ
මෙය වදාරා යළිත් මෙලෙස ගාථා වශයෙන්ද ප්‍රකාශ කල සේක.

විරූපක්ඛෙහි මේ මෙත්තං මෙත්තං ඒරාපථෛහි මේ
ඡබ්‍යාපුත්තෙහි මේ මෙත්තං මෙත්තං කණ්හාගෝතමකේහි ච.

මාගේ මෛත්‍රීය විරූපාක්ඛෂ, ඒරාපථ, ඡබ්‍යාපුත්ත, කණ්හාගොතමකං නම් සර්ප කුලයන් සමගය.

අපාදකේහි මේ මෙත්තං මෙත්තං දිපාදකේහි මේ
චතුප්පදේහි මේ මෙත්තං මෙත්තං බහුප්පදේහි මේ.
මා මං අපාදකෝ හිංසි මා මං හිංසි දිපාදකෝ
මා මං චතුප්පදෙ හිංසි මා මං හිංසි භහුප්පදෙ.

මාගේ මෛත්‍රීය පා නැති නාග පිඹුරු පොළොං ආදී උරග ජාතීන් සමගය, මාගේ මෛත්‍රීය දෙපා
ඇති මිනිසුන් සහ පක්ෂීන් සමගය, මාගේ මෛත්‍රීය හස්ති අශ්ව ගව ආදී සිව් පා ජාතීන් සමගය,
මාගේ මෛත්‍රීය පත්තෑ ගෝනුසු ආදී බොහෝ පා ඇති සත්වයන් සමගය.
උරග , දිව්පාදක, සිව්පාදක හා බහු පාදක සතුන් මා නොපෙලත්වා.

සබ්බේ සත්තා සබ්බේ පාණා සබ්බේ භූතා ච කේවලා
සබ්බේ භද්‍රානි පස්සන්තු මා කඤ්චි පාපමාගාමා.

සත්වයෝ ද ප්‍රාණීහූ ද සියලු භූතයෝ ද යන සියල්ලන්ටම යහපතක්ම වේවා,
මොවුන් අතුරෙන් කිසිවෙකුට දුකක් නොපැමිනෙත්වා.

අප්පමාණෝ බුද්ධෝ, අප්පමාණෝ ධම්මෝ, අප්පමාණෝ
සඞසෝ, පමාණවන්තානි සිරිංසපානි අහි, විච්ඡිකා, සතපදී,
උන්ණාණාභි, සරබූ, මූසිකා කතා මේ රක්ඛා කතා මේ පරිත්තා
පටික්කමන්තු භූතානි, සෝ හං නමෝ භගවතෝ නමො
සත්තංන්නං සම්මා සම්බුද්ධානන්ති.

බුදුවරුන්ගේ ගුණ අප්‍රමානය, දහම් ගුණ අපමනය, සංඝ ගුණ අපමනය,
නමුදු සියලු සත්වයෝ ප්‍රමාණවත්ය. එනම් සර්ප, ගෝනුසු, බොහෝ පා ඇති සත්වයෝ,
මකුළුවන්, සිකනලුන්, මීයන් ආදීහූය.
තෙරුවන් ගුණ සිහිකිරීමෙන්ද මා විසින් ආරක්ෂාකරන ලද්දී ය.
ම විසින් පිරිත්‍රාණයෝ පරිශීලනය කරන ලද්දාහූ ය.

මා කෙරෙහි අදහස් ඇති සියලු සත්වයෝ ඉවත්වෙත්වා. කිසිවෙකු මා නොවෙහෙසත්වා.
මා භාග්‍යවතුන් වහන්සේ වන්දනාකරමි. සත් බුදුවරුන්ටද නමස්කාර කරමි.

### ඒතෙන සච්ච වජ්ජෙන සොත්ථිතේ හෝතුසබ්බදා

මේ උතම් පිරිතෙන් ඒ පිරිතේ සත්‍යයේ බලයෙන් ඔබට නිරන්තර සුවයක් සහ ශාන්තියක්ම වේවා.

## මෙත්තානිසංස සුත්තං

ඒවං මේ සූතං, ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ, තත්‍ර බෝ භගවා භික්ඛූ ආමන්තේසි භික්ඛවෝ ති භදන්තේ ති තේ භික්ඛූ භගවතෝ පච්චස්සෝසුං භගවා ඒතදවෝච.

මා විසින් මෙසේ අසන ලදී. එකල එක් සමහයක භාග්‍යවතුන්වහන්සේ අනේපිඩු සිටුතුමා විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.
එකලහී භාග්‍යවතුන්වහන්සේ
භික්ෂූන්ට ආමන්ත්‍රනය කල සේක. ස්වාමිනී භාග්‍යවතුන්වහන්ස යි භික්ෂූන් පිලිවදන් දූන්හ.
එකල හී භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළ සේක.

මෙත්තාය භික්ඛවේ චේතෝවිමුත්තියා ආසේවිතාය භාවිතාය බහුලීකතාය යානිකතාය වත්‍ථු කතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, ඒකා දසානිසංසා පාටිකඩ්ඛා.
කතමේ ඒකාදස ?

මහනෙනි, ඔබ ආදරයෙන් සකසන ලද, එසේම පුහුනුකරන ලද, නැවත නැවත පුහුනුකරන ලද, යානාවක් මෙන් සකසන ලද, වස්තුවක් මෙන් සකසන ලද, නැවත නැවත උපදවන ලද, සියලු අන්දමින් පුරුදු කරන ලද, මනාසේ පටන්ගන්නා ලද මෛත්‍රී චිත්ත විමුක්තිය පිලිබදවූ අනුසස් එකොළෙසෙක් කෙරෙහි කැමැත්තෝ විය යුත්තාහ.
ඒ කවර එකොළෙසෙක් ද යත්,

සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, මනුස්සානං පියෝ හෝති, අමනුස්සානං පියෝ හෝති, දේවතා රක්ඛන්ති, නාස්ස අග්ගිවා විසං වා සත්ථං වා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛ වණ්ණෝ විප්පසීදති, අසම්මුළ්හෝ කාලං කරොති, උත්තරිං අප්පටිවිජ්ඣන්තෝ බ්‍රහ්මලෝකූපගෝ හෝති. මෙත්තාය භික්ඛවේ චෙතෝවිමුත්තියා ආසේවිතාය භාවිතාය බහුලීකතාය යානිකතාය වත්‍ථු කතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, ඉමෙ ඒකාදසානිසංසා පාටිකඩ්ඛාති.

සැපසේ නිදීම, සැපසේ පිබිදීම, නපුරු සිහින නොදැකීම, මිනිසුනට ප්‍රිය වීම, අමුනුෂ්‍යයනටද ප්‍රිය වීම, දෙවියන් විසින් රැකදීම, මෙවන් මෛත්‍රී විහරණ ඇත්තන්ගේ ශරීරයෙහි ගිනි හෝ, විස හෝ, සැත් හෝ නොවදී, ක්‍ෂනිකව සිත එකඟවෙයි, මුහුන පැහැපත් වෙයි, මුලානොවී කලුරිය කරයි, මෛත්‍රී සමවතින් මතුව රහත් නොවූයේ නම් මරනින් මතු බඹලොව උපදියි. මහනෙනි ආදරයෙන් සකසන ලද එසේම මනාසේ පටන්ගන්නා ලද මෛත්‍රී චිත්ත විමුක්තිය පිලිබදවූ අනුසස් භාවිත කළ කල්හී භාවිත බහුලීකෘත

කළ කල්හී යානාවක් මෙන් සකසන ලද කල්හී වස්තුවක් මෙන් සකසන ලද කල්හී මැනවින් මනාසේ පටන්ගන්නා ලද කල්හී මෙම එකොළෙළසෙක් ආනිසංසයෝ කෙරෙහි කැමැත්තෝ විය යුත්තාහුය.

## ඉදමවෝච භගවා අත්තමනා තේ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති.

භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළ සේක.
සතුටට පත්වූ එම භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේ ගේ එම දේශනාවට කැමතිවූහ.

## ඒතෙන සච්ච වජ්ජෙන සොත්ථිතේ හෝතුසබ්බදා

මේ උතම් පිරිතෙන් ඒ පිරිතේ සත්‍යයේ බලයෙන් ඔබට නිරන්තර සුවයක් සහ ශාන්තියක්ම වේවා.

# කරණීය මෙත්ත සූත්‍රය

## කරණීයමත්ථ කුසලේන යං තං සන්තං පදං අභිසමෙච්ච සක්කෝ උජූ ච සූජූච සුවචෝ චස්ස මුදු අනතිමානි

උතුම් ශාන්තිපද සංඛ්‍යාත නිර්වාණයක් වේද එය අවබෝධකොට වසනු කැමති අභිවෘද්ධිය සලසා ගැනීමට කැමති පුද්ගලයා විසින් කළයුතු පිළිවෙත් මගක් වෙයි.

## සන්තුස්සකෝ ච සුභරෝ ච අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ

ඔහු නිවන් අවබෝධය පිනිස වත් සමාදම් වීමට, පිළිපැදීමට දක්ෂ වන්නේය.
හුදු මහත් කටයුතුවල හැකිබවද සෘජු බව මෙන්ම, මනා සෘජු බවද ඇත්තේය. සුවච බවද,
මෘදු බවද, මනා නිහතමානී බවද, ඇතිකරගතයුත්තේය.

## න ච ඛුද්දං සමාචරේ කිඤ්චි යේන විඤ්ඤූ පරේ උපවදෙයියුං සුඛිනෝ වා ඛෙමිනෝ හොන්තු සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

ලද දෙයින් තුටුවීමද, පහසුවෙන් පෝෂණයට හැකිවීමද, අල්ප කෘත්‍යතාවයද, සැහැල්ලු පැවතුම් ඇතිබවද, සන්සුන් ඉඳුරන් ඇති බවද, උතුම් නුවණද කඩිසරබවද, ගිහිගෙවල අනිසි නොඇල්මද, තිබිය යුතුයි. හැඩි දැඩි අසංවර ගති මෙන්ම කුලයන් කෙරෙහි නොඇලුනෙක් වන්නේය.

## යේ කේචි පාණභූත ත්ථි තසා වා ථාවරා වා අනවසේසා දීඝා වා යේ මහන්තාවා මජ්ඣිමා රස්ස කාණුකථූලා

නුවණැති අන්‍යයන්ගේ අවමානයට ලක්වන කුඩා දෙයකුදු නොකරන්නේය. සියලුම
සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා භය නැත්තෝ වෙත්වා. සුඛිත සිත් ඇත්තෝ වෙත්වා.

## දිට්ඨා වා යේව අද්දිට්ඨා යේ ච  දූරේ වසන්ති අවිදූරේ භූතා වා සම්භවේසී වා සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

තෘෂ්ණා භය නිසා තැතිගන්නා වූ ද, තෘෂ්ණා භය නොමැති හෙයින් ස්ථාවර වූ ද, දිග, කෙටි, මහත, මධ්‍යම, විශාල, සියුම් ශරීර ඇත්තෝ ද, සියලු දිය ගොඩ වෙසෙන හැම සත්තුහූද, පෙනෙන, නොපෙනෙන, දුර, ළඟ, වෙසෙන සත්හූද, උපතට පැමිනි සහ උපතක් සොයන සත්තුහූද, ඉපදීම අවසන් කල සත්තුහූද, සියල්ලෝම සැප ඇත්තෝ වෙත්වා.

න පරෝ පරං නිකුබ්බේථ නා තිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

කෙනෙකු තව කෙනෙකුට වංචා නොකරත්වා, අවමන් නොකරත්වා, කෝපයෙන්, ද්වේශයෙන්, කටයුතු නොකරත්වා, අන් අයගේ දුක් කැමති නොවේවා. කය වචනය පිලිබඳ විකෘතියෙන් ද මනෝවිය්‍යාකූලත්වයෙන් ද කෙනෙකු තව කෙනෙකුට දුකක් නොවේවා.

මාතා යථා නියං පුත්තං ආයුසා ඒකපුත්ත මනුරක්ඛේ
ඒවම්පි සබ්බ භූතේසු මානසං භාවයේ අපරිමාණං

සිය පණ මෙන් රකින, එක පුතු ඇති මව මෙන්, සියලු සත්වයන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රිය පතුරත්වා.

මෙත්තං ච සබ්බලෝකස්මිං මානසං භාවයේ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියං ච අසම්බාධං අවේරං අසපත්තං

උඩටද, යටටද, හරහටද, හැම දෙයට ඇති බාධා, හිරිහැර, වෛර චේතනා, කරදර, නැතිවන සේ, සැම සත වෙත මෛත්‍රීය පතුරත්වා.

තිට්ඨං චරං නිසින්නෝ වා සයානෝවා යාවතස්ස විගතමිද්ධෝ
ඒතං සතිං අධිට්ඨෙය්‍ය බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

සිටගෙනද, ඇවිදිමින්ද, සයනයකරමින්ද, අවදියෙන්ද, සැම කල්හී මේ මෛත්‍රී සහගත සිහියෙන්ම යුතු වෙත්වා. මෙය බුද්ධ ශාසනයේ ශ්‍රේෂ්ඨ විහරණය වේ.

දිට්ඨිං ච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං නහි ජාතු ගබ්බසෙය්‍යං පුනරේතී ති

මිත්‍යා දෘෂ්ඨියට නොපැමින, උතුම් දැක්මෙන් යුක්තව, වස්තු කාමයෙහි නොඇලී ජීවිතය ගෙවන්නා, යලි උපතට නොපැමිණේ, ඉපිද රහත් බවට පැමිණ නිවන්මගට පැමිණ පිරිනිවන් පාන්නේය.

ඒතේන සච්ච වජ්ජේන සබ්බ රෝග විනස්සතු
ඒතේන සච්ච වජ්ජේන සබ්බ භය විනස්සතු
ඒතේන සච්ච වජ්ජේන සබ්බ දුක්ඛ විනස්සතු

මේ උතම් පිරිතෙන් ඒ පිරිතේ සත්‍යයේ බලයෙන් සියළු රෝග, සියළු භය, සියළු දුක්, සැනෙකින් දුරුවී ඔබට නිරන්තර සුවයක් සහ ශාන්තියක්ම වේවා.

# ජය පිරිත

සිරි ධිති මති තේජෝ
ජයසිද්ධි මහිද්ධි මහා ගුණං
අපරිමිත පුඤ්ඤාධිකාරස්ස
සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස
භගවතෝ අරහතො සම්මා සම්බුද්ධස්ස

ශ්‍රී සෞභාග්‍ය ධෛර්‍යය
බුද්ධි තේජස් ඇත්තාවූද
ජයසිරි මහා ඉර්ධි මහාගුණ ඇත්තාවූද
උප්‍රමාණ පුන්‍යසම්පත්තියක් ඇත්තාවූද
සකලාන්තරාය දූරීභූත කිරීමේ ශක්තිය
ඇත්තාවූද
ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්
සම්බුදුරජානන් වහන්සේගේ

ද්වත්තිංස මහාපුරිසලක්ඛණානුභාවෙන
අසීත්‍යානුව්‍යඤ්ජන ලක්ඛණානුභාවෙන
අට්ඨුත්තරසත මංගල
ලක්ඛාණුනුභාවෙන
ඡබ්බණ්ණරංස්‍යානුභාවෙන
කේතුමාලානුභාවෙන
දසපාරමිතානුභාවෙන
දසඋපපාරමිතානුභාවෙන
දසපරමත්තපාරමිතානුභාවෙන
සීලසමාධිපඤ්ඤානුභාවෙන
බුද්ධානුභාවෙන ධම්මානුභාවෙන
සංඝානුභාවෙන තේජානුභාවෙන
ඉධ්‍යානුභාවෙන බලානුභාවෙන
ඤෙය්‍යධම්මානුභාවෙන
චතුරාසීතිසහස්ස
ධම්මක්ඛන්ධානුභාවෙන නවලොකුත්තර
ධම්මානුභාවෙන
අට්ඨංගිකමග්ගානුභාවෙන
අට්ඨසමාපත්‍යානුභාවෙන
ඡළභිඤ්ඤානුභාවෙන මෙත්තා කරුණා
මුදිතා උපෙක්ඛානුභාවෙන
සබ්බපාරමිතානුභාවෙන
රතනත්තය සරණානුභාවෙන
තුය්හං සබ්බරෝග සෝක උපද්දව
දුක්ඛදෝමනස්සුපායාසා
විනස්සන්තු සබ්බසංකප්පා තුය්හං
සමිජ්ඣන්තු දීඝායුකෝ හෝතු සත
වස්ස ජීවෙන සමංගිකෝ
හෝතු සබ්බදා

දෙතිස් මහා පුරිස් ලක්ෂන අනුහසින්ද
අසූ අනුව්‍යඤ්ජන ලක්ෂන අනුහසින්ද
එකසිය අටක් මඟුල් ලක්ෂන අනුහසින්ද
සවනක් සණ බුදුරැස් අනුහසින්ද

කේතුමාලාවේ අනුහසින්ද
දස පාරමිතාවන්ගේ අනුහසින්ද
දස උප පාරමිතාවන්ගේ අනුහසින්ද
දස පරමාර්ථ පාරමිතාවන්ගේ
අනුහසින්ද

සීල සමාධි ප්‍රඥාවන්ගේ අනුහසින්ද
සම්බුදුරදුන්ගේ අනුහසින්ද
සදහම් බලයේ අනුහසින්ද
මහ සඟරුවනගේ අනුහසින්ද

තේජස්වල අනුහසින්ද
ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයේ අනුහසින්ද
අටසමවත් අනුහසින්ද
ෂඩ් අභිඥාවන්ගේ අනුහසින්ද

මෛත්‍රී කරුනා මුදිතා උපේක්ෂා
ගුනයන්ගේ අනුහසින්ද
සියළු පාරමිතාවන්ගේ අනුහසින්ද
තෙරුවන් සරණේ අනුහසින්ද

මාගේ සියළු රෝගද
සියළු ශෝකයන්ද සියළු උවදුරුද
සියළු දුක් දොම්නස්ද
දුරුවේවා
මාගේ සියළු පැතුම් ඉටුවේවා
දීර්ඝායුෂ ලබා
සියවසක් ජීවත්වීමේ වාසනාව
උදාවේවා

ආකාස පබ්බත වන භූමි තටාක
ගංගා මහා සමුද්ද ආරක්ඛක
දේවතාසදා තුම්හේ අනුරක්ඛන්තු සබ්බ
බුද්ධානුභාවේන සබ්බ ධම්මානුභාවේන
සබ්බ සංඝානුභාවේන
බුද්ධරතනං ධම්මරතනං සංඝරතනං
තින්නං රතනානං ආනුභාවෙන

අහසද පර්වතද වන භූමි තටාකයන්ද
ගංගා හා මහා සමුද්‍රයටද
උධිගෘහිත වූ සියළු දෙවියෝ
සදා කල්හීම අප රැකදෙත්වා

සියළු බුදු බලයෙන්ද
සියළු සදහම් බලයෙන්ද
සියළු සඟසරණින්
බුදුන් දහම් සඟුන්
යන තෙරුවන් බලයෙන්ද
අසූහාර දහසක්

චතුරාසිති සහස්ස
ධම්මක්ඛන්ධානුභාවේන
පිටකත්තයානුභාවේන
ජිනසාවකානුභාවේන
සබ්බේ තේ රොගා සබ්බේ තේ භයා
සබ්බේ තේ අන්තරායා සබ්බේ තේ
උපද්දවා සබ්බේ තේ දුන්නිමිත්තා
සබ්බේ තේ අවමංගලා විනස්සන්තු
ආයුවඩ්ඪකෝ ධනවඩ්ඪකෝ
සිරිවඩ්ඪකෝ යසවඩ්ඪකෝ
බලවඩ්ඪකෝ වණ්ණවඩ්ඪකෝ
සුඛවඩ්ඪකෝ හෝතු සබ්බදා

දුක්ඛ රෝග භයා වේරා
සෝකා සබ්බේ උපද්දවා අනේකා
අන්තරායාපි විනස්සන්තු ච තේජසා
ජය සිද්ධි ධනං ලාභං සොත්ථි භාග්‍යාං
සුඛං බලං සිරි ආයු ච වණ්ණො ච
භොගං වුද්ධි ච යසවා සතවස්සා ච
ආයුව ජීව සිද්ධි භවන්තුතේ

ධර්මස්කන්ධයේ බලයෙන්ද
තුන් පිටකයේ බලයෙන්ද
බුද්ධ ශ්‍රාවකයන්ගේ බලයෙන්ද

මාගේ සියළු රෝගද
මාගේ සියළු බියද
මාගේ සියළු අන්තරායයන්ද
මාගේ සියළු උවදුරුද
මාගේ සියළු අසුබ නිමිතිද
මාගේ සියළු අවමංගලයයන්ද
විනාශ වේවා ආයු වැඩිවේවා
ධනයේ දියුණුව වේවා
සිරිය වැඩිවේවා
යසස බලය දියුණුව වේවා
පැහැය වැඩිවේවා
සැපය තව වැඩිවේවා
නිදුක් බව වේවා
සදාකල්හිම ජයම වේවා
සියළු දුක් රෝග බිය
සෝක උවදුරු වෛරය දුරුවී
සාමය උදාවී
අනේක වූ අනතුරු දුරුවේවා
ජය ධන ලාබ
යහපත වාසනාව උදාවේවා
සැප බල සිරිය
ආයුස පැහැය වැඩිවේවා
සම්පත යසස දියුණුව
නොමදව ලබමින්
සියවස් ආයු ලබමින් ද
නිබද යෙහෙන් සැරදේවා

# මහා ජය මඞ්ගල ගාථා

මහා කාරුණිකෝ නාථෝ හිතාය සබ්බපාණීනං
පූරෙත්වා පාරමී සබ්බා පත්තෝ සම්බෝධිමුත්තමං
ඒතෙන සච්චවජ්ජේන හෝතු තේ ජය මංගලං

සියළු සතුනට හිතැතිවූ මහා කාරුණිකයානන් වහන්සේ, පාරමී දම් පුරා, උතුම් බුද්ධත්වය ලබාගත් සේක.
මේ සත්‍යයේ වචනයෙන් අප සැමට ජය මංගල්‍යයක් වේවා.

ජයන්තෝ බෝධියා මූලේ සක්‍යානං නන්දි වද්ධනෝ
ඒවං තුය්හං ජයෝ හෝතු ජයස්සු ජය මංගලං

සියළු සතුන්ගේ සිත් සතන් සනසමින් අප මහා බෝසතානෝ ශ්‍රී මහා බෝ සමිදු පා මුල මාර සේනා
ජයගත් සේක. අපටද නියත ජය ලැබේවා. අපටද ජය මංගල්‍යයක්ම වේවා.

සක්කත්වා බුද්ධරතනං ඕසධං උත්තමං වරං
හිතං දේව මනුස්සානං බුද්ධ තේජේන සොත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ දුක්ඛා වූපසමෙන්තු තේ

සියළු දෙව් මිනිසුන්ගේ හිත සුව සහනය පිනිස වූ ඖෂධයකට සමවූ, බුදුවරුන්ගේ බුද්ධ ගුණයෙන් අප
සැමගේ සියළු දුක් නැසේවා. සියළු දුක් දුරුවේවා.

සක්කත්වා ධම්මරතනං ඕසධං උත්තමං වරං
පරිළාහූපසමනං ධම්මතේජේන සොත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ භයාවූපසමේන්තු තේ

සියළු දුක් වේදනා සංසිඳුවන උතුම් වූ ඖෂධයකට සමවූ, සම්මා සම්බුදු දහමේ බලයෙන් අප සැමගේ ඇතිවන සියළු භය නැසේවා. සියළු බිය දුරුවේවා.

සක්කත්වා සංඝරතනං ඕසධං උත්තමං වරං
ආහුණෙය්‍යං පාහුණෙය්‍යං සංඝ තේජේන සොත්ථිනා
නස්සන්තුපද්දවා සබ්බේ රෝගා වූපසමේන්තු තේ

පින් කෙතක් බඳු වූ උතුම් වූ ඖෂධයකට සමවන දුර සිට ගෙන එනු ලබන දහම් පඬුරු, දන් පිලිගැනීමට සුදුසු වූ මහා සංඝරත්නයේ බලයෙන් අප සැමගේ ඇතිවන සියළු රෝග උවදුරු නැසේවා.

යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථූ
රතනං බුද්ධ සමන් නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ

ලෙවෙ ඇති අනේක වූ රුවන් අතරින් බුදුරුවනට සම වෙනත් රුවනක් නැත්තේමය. ඒ බුදුරුවනේ බලයෙන් අපහට සුව සෙත ලැබේවා.

යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථූ
රතනං ධම්ම සමන් නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ

ලෙවෙ ඇති අනේක වූ රුවන් අතරින් සඟරුවනට සම වෙනත් රුවනක් නැත්තේමය. ඒ සඟරුවනේ බලයෙන් අපහට සුව සෙත ලැබේවා.

යං කිඤ්චි රතනං ලෝකේ විජ්ජති විවිධා පුථූ
රතනං සංඝ සමන් නත්ථි තස්මා සොත්ථි භවන්තු තේ
ලෙවෙ ඇති අනේක වූ රුවන් අතරින් දම්රුවනට සම වෙනත් රුවනක් නැත්තේමය. ඒ දම්රුවනේ බලයෙන් අපහට සුව සෙත ලැබේවා.

නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජයමංගලං

මා හට බුදුසරණ මිස අන් සරණක් නොමැත. මේ සැබෑ වදනින් අපසැමට ජය මංගල්‍යයක් වේවා.

නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජයමංගලං

මා හට දහම් සරණ මිස අන් සරණක් නොමැත. මේ සැබෑ වදනින් අපසැමට ජය මංගල්‍යයක් වේවා.

නත්ථි මේ සරණං අඤ්ඤං සංඝො මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජයමංගලං

මා හට සඟ සරණ මිස අන් සරණක් නොමැත. මේ සැබෑ වදනින් අපසැමට ජය මංගල්‍යයක් වේවා.

සබ්බීතියො විවජ්ජන්තු සබ්බ රෝගෝ විනස්සතු
මා තේ භවත්වන්තරායෝ සුඛී දීඝායුකො භව

සියළු උවදුරු දුරුවේවා. සියළු රෝග නැතිවේවා. කිසිදු ආන්තරායක් නොමවේවා. දීඝආයුස ලැබේවා.

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බදේවතා
සබ්බ බුද්ධානුභාවේන සදා සොත්ථි භවන්තු තේ

සියළු බුදු බලයෙන් සියළු දෙවියෝ රැකදෙවත්වා. ඒ සියළු බලයෙන් අපට සදා සුවසෙත අත්වේවා.

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බදේවතා
සබ්බ ධම්මානුභාවේන සදා සොත්ථි භවන්තු තේ

සියළු දහම් බලයෙන් සියළු දෙවියෝ රැකදෙවත්වා. ඒ සියළු බලයෙන් අපට සදා සුවසෙත අත්වේවා.

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බදේවතා
සබ්බ සංඝානුභාවේන සදා සොත්ථි භවන්තු තේ

සියළු සඟ බලයෙන් සියළු දෙවියෝ රැකදෙවත්වා. ඒ සියළු බලයෙන් අපට සදා සුවසෙත අත්වේවා.

නක්ඛත්ත යක්ඛ භූතානංපාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවේන හන්තු තේසං උපද්දවේ

නැකැත් වලින්, ග්‍රහ අපල වලින්, සිදුවන සියළු උවදුරු මේ පිරිතේ අණුහසින් දුරුවේවා.

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච, යෝචා මනාපෝ සකුනස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං, බුද්ධානුභාවේන විනාසමෙන්තු

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච, යෝචා මනාපෝ සකුනස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං, ධම්මානුභාවේන විනාසමෙන්තු

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච, යෝචා මනාපෝ සකුනස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං, සංඝානුභාවේන විනාසමෙන්තු

යම් අසුභ නිමිත්තක්, අයහපතක්, මනාපනොවූ යම් පක්ෂියකුගේ ශබ්දයක්, පාපග්‍රහයන්ගේ නරක සිහිනයක් වේ නම් බුද්ධානුභාවයෙන් විනාසවේවා, ධම්මානුභාවයෙන් විනාසවේවා, සංඝානුභාවයෙන් විනාසවේවා.

සබ්බේ බුද්ධා බලප්පත්තා පච්චේකානඤ්ච යං බලං
අරහන්තානඤ්ච තේජේන රක්ඛං බන්ධාමි සබ්බසෝ

සියළු බුදුවරුන්ගේ බලයෙන් සියළු පසේ බුදුවරුන්ගේ ශක්තියෙන් සියළු රහතුන්වහන්සේලාගේ තේජසින් ඔබසැම ආරක්ෂාවේවා.

දේවො වස්සතු කාලේන සස්ස සම්පත්ති හෝතු ච
පීතෝ භවතු ලෝකෝච රාජා භවතු ධම්මිකො

කලට වැසි වසීවා, භවබෝග සම්පත් ලැබේවා, සියළු සත්වයන් භීතියෙන් මිදේවා, රජවරු දැහැමින් රජ්‍ය පාලනය කරත්වා.

## ඉමිනා පුඤ්ඤකම්මේන මා මේ බාලසමාගමෝ
## සතං සමාගමෝ හෝතු යාව නිබ්බාණ පත්තියා

මෙසේ කරන ලද සියලු පුණ්‍ය කර්මයන්ගේ හේතුවෙන් නිවන් දක්නා ජාති දක්වා අසත්පුරුෂ, අනුවන,
බාල, ඇසුරක් නොමවේවා යහපත් උතුම් සත් පුරුෂ ඇසුරක්ම වේවා.

★★★

මීගමුවේ කුරන මංගල පාරේ පදිංචි,
ශ්‍රීලාල් සිල්වා මහතා ගේත් ගීතානී සිල්වා මහත්මිය ගේත්
පුතනුවන් උදාර කෞෂල්‍ය ගේත් දියණිය අක්ෂනා උමාදවී ගේත්
සාශානික මෙහෙවරට තුටු පඬුරක් ලෙසින්
සියළු ලෝ වාසීන්ට නීරෝගී
සුව ප්‍රාර්ථනා කරමින්, දහම් පඬුරක් ලෙසින්, හිතමිත්‍රාදීන් විසින්
වර්ෂ 2010 දුරුතු මස 14 වන දින
පලමු මුද්‍රණය කරවන ලදී.

---

පිරුවානා පොත් වහන්සේ අනුශාරයෙන් උපුටාගනිමින් සකස්කළේ දේවප්‍රිය සහ ශ්‍යාමලි.

**පායාසී** - භවත් කාශ්‍යපයන් වහන්ස, මම ඒ භගවත් ගෞතමයන් වහන්සේද ධර්මය ද, භික්ෂු සංඝයා ද, සරණ යමි. භවත් කාශ්‍යපයන් වහන්ස මා අද සිට දිවිහිම් කොට සරණ ගිය උවසවකු කොට සලකන සේක්වා ! භවත් කාශ්‍යපයන් වහන්ස යම් දානයක් මට දිගු කලක් වැඩ පිණිස සුව පිණිස වන්නේද, එසේ වූ මහ දානයක් දෙන්නට කැමැත්තෙම් ද වෙමි. එහි ලා භවත් කාශ්‍යපයන් වහන්සේ මට අනුශාසනා කරන සේක්වා !

කුමාරකසුප් - රාජ්‍යයෙනි, යම් බඳු දානයෙක ගවයෝ හෝ මරණු ලැබෙත් ද, එළුවෝ තිරෙළුවෝ හෝ මරණු ලැබෙත් ද, කුකුළෝ, ඌරෝ හෝ මරනු ලැබෙත් ද, විවිධ ප්‍රාණීහු හෝ මරණයට පැමිණෙත්ද, එය පිළිගන්නෝත් මිථ්‍යා දෘෂ්ටි ඇත්තෝ මිථ්‍යා සංකල්ප ඇත්තෝ මිථ්‍යා වචන ඇත්තෝ මිථ්‍යා කර්මාන්ත ඇත්තෝ මිථ්‍යා ආජීවය ඇත්තෝ මිථ්‍යා ව්‍යායාමය ඇත්තෝ මිථ්‍යා ස්මෘතිය ඇත්තෝ මිථ්‍යා සමාධිය ඇත්තෝ වෙති. රාජන්‍යයෙනි මේ බඳු වූ දානය වූ කලි මහත් ඵල ඇත්තේ නොවෙයි, මහත් අනුසස් ඇත්තේ නොවෙයි. මහත් බැබලීම් ඇත්තෝ වෙයි. මහත් පැතිරීම් ඇත්තේ වෙයි. රාජන්‍යයෙනි, යම් බඳු වූ දානයෙක වනාහි ගවයෝ නො ම මරනු ලැබෙත් ද, එළුවෝ තිරෙළුවෝ නො ම මරනු ලැබෙද් ද, කුකුළෝ, ඌරෝ නො ම මරනු ලැබෙද්ද විවිධ ප්‍රාණීහු මරණයට හො පැමිණෙත් ද, ඒ දානය පිළිගන්නෝත් සම්‍යක් දෘෂ්ටි ඇත්තා හු, සම්‍යක් සංකල්ප ඇත්තා හු, සම්‍යක් වචන ඇත්තා හු, සම්‍යක් කර්මාන්ත ඇත්තා හු සම්‍ය ආජීවය ඇත්තා හු, සම්‍යක් ව්‍යායාමය ඇත්තා හු, සම්‍යක් ස්මෘතිය ඇත්තා හු, සම්‍යක් සමාධිය ඇත්තා හු වෙත් ද, රාජ්‍යයෙනි මෙබඳු වූ දානය මහත් ඵල ඇත්තේ වෙයි, මහත් අනුසස් ඇත්තේ වෙයි, මහත් බැබලීම් ඇත්තේ වෙයි.

- දීඝ නිකාය (පායාසිරාජන්‍ය සූත්‍රය) -

සියළු සතුන් කර්මානුරූපීව උත්පත්ති ලබා ඇත.

සියළු සතුන් තම ජීවිත වලට ප්‍රිය කරති.

කිසිම සත්වයකු නොමරන්න, නො, මරවන්න.

ස්වකීය ජීවිතයේ නිවීම පිණිස නිර්මාංශ වන්න.

සකස් කිරීම - ශ්‍රී ලාල් සිල්වා,
38/1, රජ මාවත,
කුරණ, මීගමුව.
☎ : 071 8202711